ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
**දෙසැම්බර් 2016**

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

- **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** 2016 දෙසැම්බර් මාසයේ දී 58.3 ක දර්ශක අගයක් වාර්තා කරමින් අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරන ලදී. මේ සඳහා, පසුගිය වසරට සාපේක්ෂව නව ඇණවුම් උප දර්ශකයේ වාර්තා වූ ඉහළ වර්ධනය බෙහෙවින් දායක වූ අතර නිෂ්පාදන උපදර්ශකය ද ධනාත්මක දායකත්වයක් දැක්වීය. මේ අතර, උත්සව සමයේ දී නිවාඩු දින ඉහළ යාම හේතුවෙන් නොවැම්බර් මාසයට සාපේක්ෂව සේවා නියුක්ති උප දර්ශකය මන්දගාමී වූ අතර උත්සව සමයට සමගාමීව පැවති ඉහළ ඉල්ලුම සපුරාලීමට ඒ වනවිටත් රැස්කරගත් තොග භාවිතා කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් තොග ගැනුම් උප දර්ශකය ද මන්දගාමී විය. ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උපදර්ශකය ද සුළු වශයෙන් වර්ධනය විය. මෙහිදී සියලුම උපදර්ශක කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරන ලදී. මේ අතර, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් නොවැම්බර් මාසයට වඩා අඩු මට්ටමකින් වුවද යහපත් වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

- **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** 2016 නොවැම්බර් මාසයේ දී වාර්තා කළ 59.7 ක දර්ශක අගයක සිට දෙසැම්බර් මාසයේ දී 59.8 ක දර්ශක අගයක් දක්වා සුළු වශයෙන් ඉහළ යන ලදී. ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි සිදු වූ මෙම ඉහළ යෑමෙන් 2016 දෙසැම්බර් මාසයේ දී සේවා අංශයෙහි ආර්ථික ක්‍රියාකාරකම් පසුගිය මාසයට සාපේක්ෂව මද වශයෙන් ඉහළ වේගයකින් වර්ධනය වූ බව පෙන්නුම් කරයි. නව ව්‍යාපාර සහ ව්‍යාපාර ක්‍රියාකාරකම් යන උප දර්ශකවල සිදු වූ වර්ධනයන් හේතුකොට ගෙන සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ඉහළ යන ලදී. සේවා නියුක්තිය සහ අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් උප දර්ශක පසුගිය මාසය හා සැසඳීමේ දී 2016 දෙසැම්බර් මාසයේ දී පහළ යන ලදී. තවද, නිම කිරීමට ඇති කාර්යයන් නොවැම්බර් මාසයට වඩා අඩු වේගයකින් 2016 දෙසැම්බර් මාසයේ දී පහළ යන ලදී. අය කරන මිල ගණන් (ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ගණනය කිරීමේ දී සලකා නොබලන) නොවැම්බර් මාසයට සාපේක්ෂව 2016 දෙසැම්බර් මාසයේ දී අඩු වේගයකින් ඉහළ යන ලදී.

| | වා\මා | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජූනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | 2015 | n.a. | n.a. | n.a. | n.a. | 67.3 | 57.5 | 55.5 | 56.5 | 53.2 | 57.8 | 54.8 | 57.9 |
| | 2016 | 51.9 | 55.3 | 60.7 | 41.6 | 47.9 | 55.1 | 50.6 | 53.5 | 57.7 | 56.5 | 58.4 | 58.3 |
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | 2015 | n.a. | n.a. | n.a. | n.a. | 66.8 | 65.0 | 60.6 | 59.8 | 61.7 | 59.5 | 59.3 | 60.2 |
| | 2016 | 58.0 | 59.3 | 61.6 | 54.7 | 58.1 | 56.3 | 57.8 | 61.2 | 57.7 | 59.3 | 59.7 | 59.8 |


නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
100.0
50.0
0.0
67.3 57.5 55.5 56.5 53.2 57.8 54.8 57.9 51.9 55.3 60.7 41.6 47.9 55.1 50.6 53.5 57.7 56.5 58.4 58.3
2015
2016
නව ඇණවුම් දර්ශකය
නිෂ්පාදන දර්ශකය
සේවා නියුක්ති දර්ශකය
ගැනුම් තොග දර්ශකය
ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාල දර්ශකය
නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය


සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
100.0
50.0
0.0
66.8 65.0 60.6 59.8 61.7 59.5 59.3 60.2 58.0 59.3 61.6 54.7 58.1 56.3 57.8 61.2 57.7 59.3 59.7 59.8
2015
2016
නව ව්‍යාපාර දර්ශකය
ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය
සේවා නියුක්ති දර්ශකය
නිම කිරීමට නියමිත කාර්යයන් දර්ශකය
අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය
සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

තාක්ෂණික සටහන:

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.